# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2072/19 - 2018 මැයි මස 22 වැනි අඟහරුවාදා - 2018.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ චුන්නාකම් ජල කුළුණ ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 15 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1368.

### උපලේඛනය

යාපනය දිස්ත්‍රික්කයේ, උඩුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/199, චුන්නාකම් බටහිර නගර ග්‍රාම නිලධාරී වසමේ චුන්නාකම් ගමේ පිහිටි සෝනවත්තෙකලඩ්ඩි, සෝනවත්තේ සහ තේවිරනෙයි නැමති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු සැලසුම් අංක 2967 හි කැබලි අංක 1 ලෙස දැක්වෙන හෙක්ටයාර් 0.0686 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | නිවාසවල සිට ප්‍රධාන මාර්ගය දක්වා පාර ; |
| *නැගෙනහිරට* | : | වෛයිරාවර් කෝවිල සතු ඉඩම හා මුරුගේසු සුන්දරරාජන් මහතා සහ බිරිඳ ලින්ගේස්වරී මිය හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | මුරුගේසු සුන්දරරාජන් මහතා සහ බිරිඳ ලින්ගේස්වරී මිය හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | සුබ්බ්‍රමනියම් මනෝහරන් මහතා සහ බිරිඳ චන්ද්‍රිකා මිය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : මුරුගේසු සුන්දරරාජන් මහතා සහ ලින්ගේස්වරී මිය,<br>
කොට්ඨාස අංක 04,<br>
තේවරනි පාර,<br>
චුන්නාකම්.

06 - 359

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ පිරිපහදු කරන ලද ජලය රැගෙන යන නළ මාර්ගය සඳහා ඉඩම් කොටස් තුනක අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 මැයි මස 15 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1346.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 238 - වට්ටාරන්තැන්න/250 - පිටකන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, වට්ටාරන්තැන්න/පිටකන්ද යන ගම් වල පිහිටි (ඉඩමේ නම නොදනී) ඉඩම් වල සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් තුන :

කැබලි අංක 01 - ප්‍රමාණය : පර්චස් 3.5 ක් පමණ

*උතුරට* : ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලයේ ක්‍රීඩාංගනය ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : අස්ගිරිය රජමහා විහාරයට අයත් ඉඩම් කොටස ;
*බටහිරට* : ඇල මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* :
01. ගරුතර වේඩරුවේ උපාලි නායක ස්වාමීන්වහන්ස,
විහාරාධිපති,
අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරය, අස්ගිරිය, මහනුවර.
02. වයලට් ගුණරත්න මහත්මිය සහ තවත් අය,
7/1, සියඹලාගස්තැන්න පාර, මහනුවර.

කැබලි අංක 02 - ප්‍රමාණය : පර්චස් 5.5 ක් පමණ

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : නානායක්කාර මහතා හිමිකම් කියන ඉඩම ;
*දකුණට* : අස්ගිරිය රජමහා විහාරයට අයත් ඉඩම් කොටස ;
*බටහිරට* : යෝජිත කැබලි අංක 01.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* :
01. ගරුතර වේඩරුවේ උපාලි නායක ස්වාමීන්වහන්ස,
විහාරාධිපති,
අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරය, අස්ගිරිය, මහනුවර.
02. වයලට් ගුණරත්න මහත්මිය සහ තවත් අය,
7/1, සියඹලාගස්තැන්න පාර, මහනුවර.

කැබලි අංක 03 - ප්‍රමාණය : පර්චස් 01 ක් පමණ

*උතුරට* : ප්‍රවේශ මාර්ගය ;
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස හා අත්කර ගැනීමට යෝජිත කැබලි අංක 02 ;
*බටහිරට* : වයලට් මහත්මිය හිමිකම් කියන ඉඩම හා ප්‍රවේශ මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* :
01. ගරුතර වේඩරුවේ උපාලි නායක ස්වාමීන්වහන්ස,
විහාරාධිපති,
අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරය, අස්ගිරිය, මහනුවර.
02. නානායක්කාර මහතා සහ තවත් අය,
නො : 21/5, මෙත්සිරිපාය, කටුගස්තොට.

06 - 360

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.